ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම/හයවන මට්ටම - 2022/2023
අවසාන පරීක්ෂණය 2023
**STU5415/STU6306** - අධ්‍යාපන කළමනාකරණය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.11.15 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ‘කළමනාකරණය’ යන පදය පැහැදිලි කරන්න.

02. ඵලදායී පාසලක ලක්ෂණ පහක් (05) නම් කරන්න.

03. පරිපාලනය සහ කළමනාකරණය යන සංකල්ප වෙන් කොට දක්වන්න.

04. ගුරුවරයෙකුගේ “වෘත්තීය වගවීමේ” වැදගත්කම අවධාරණය කරන්න.

05. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ පද්ධතියේ ධූරාවලි ව්‍යුහය ඇඳ දක්වන්න.

06. පාසලේ විදුහල්පතිවරයෙකුගේ උපදේශන නායකත්වය පැහැදිලි කරන්න.

07. අරමුණු මගින් කළමනාකරණය (MBO) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? විස්තර කරන්න.

08. පාසලට අදාළව කළමනාකරණ ක්‍රියාවලියේ අදියර හතර (04) පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) 1AB පාසලක ආයතනික ව්‍යුහය ඇඳ දක්වන්න. (ලකුණු 04)

(ii) 1AB පාසලක විදුහල්පතිවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ සංවිධාන ව්‍යුහය විදුහල්පතිවරයාට නායකයකු ලෙස ඔහුගේ/ඇයගේ කාර්යභාරය ඉටු කිරීමට උපකාර වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. (i) 1987 දී 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් බලය බෙදීම මඟින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ඇති කළ වෙනස්කම් හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කළ වෙනස්කම් මගින් රටේ අධ්‍යාපනය තුළ බලාපොරොත්තු වූ ධනාත්මක ප්‍රතිඵල මොනවා ද? හේතු තුනක් **(03)** දක්වන්න. (ලකුණු 08)

(iii) එය වර්තමාන අධ්‍යාපනයට සහ රටේ සංවර්ධනයට බලපා ඇති ආකාරය හේතු තුනක් **(03)** සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) පන්තිකාමර කළමනාකරණය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) ගුරුවරයෙකු ලෙස ඔබේ පන්තිය කළමනාකරණය කිරීමේ දී ඔබ සලකා බැලිය යුතු අංග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ අංග ඔබේ ඉගැන්වීමට පහසුකම් සපයන්නේ කෙසේද ? උදාහරණ තුනක් **(03)** සමග සාකච්ඡා කරන්න. (ලකුණු 08)

12. (i) අධීක්ෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පාසලේ විදුහල්පතිවරයාගේ අධීක්ෂණ කාර්යභාරය විභාග කරන්න. උදාහරණ තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) විදුහල්පතිවරයාගේ අධීක්ෂණ භූමිකාව පාසලේ දියුණුව සඳහා පහසුකම් සපයන ආකාරය උදාහරණ තුනක් **(03)** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) අධ්‍යාපන කළමනාකරුවන් යනු කවුරුන් ද? (ලකුණු 04)

(ii) අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීමෙන් අධ්‍යාපන පද්ධතියට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරුවන් සඳහා පුහුණුව ලබා දීමේ දී මුහුණ දෙන ගැටලු දෙකක් **(02)** සාකච්ඡා කර ඉහත සඳහන් ගැටලු මඟහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

හිමිකම ඇවිරිණි.